-	භාණ්ඩාගාර අග්‍රිම		1,505,595,000	1,513,548,000	**ඒසීඒ-3**
-	තැන්පතු		6,719,712	11,163,149	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		28,744,493	51,974,897	**ඒසීඒ-5/5(ඒ)**
-	වෙනත් ලැබීම්		75,247,876	72,039,079	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,616,307,081**	1,648,725,125	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,616,307,081**	1,648,725,125	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**			-	
1,317,660,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,290,775,515	1,257,017,315	
377,340,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	351,048,407	300,076,455	**ඒසීඒ-2(ii)**
13,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	12,648,168	12,170,124	
-	පොළී ගෙවීම්	**8**	0	0	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	0	41,250	
1,708,000,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**1,654,472,091**	1,569,305,144	

	මූලධන වියදම්				
46,832,940.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	35,397,981	71,962,185	
24,366,500.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	23,499,117	42,529,342	
2,258,500.00	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	2,124,815	2,118,224	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	0	0	
1,875,000.00	හැකියා වර්ධනය	**14**	1,866,200	8,349,775	
12,167,060.00	වෙනත් මූලධන වියදම්	**15**	11,190,058	13,826,068	
87,500,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**74,078,172**	138,785,594	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)			-	
	තැන්පතු ගෙවීම්		9,618,737	78,473,150	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		23,679,415	57,225,029	**ඒසීඒ-5**
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		1,761,848,415	1,843,788,917	
-	**2020 දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		-145,541,334	(195,063,792)	

3.2. 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2020**	**2019**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,919,728,285	4,714,751,263
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	108,991,435	114,056,513
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	1,042	5,748
මුළු වත්කම්		**4,028,720,762**	**4,828,813,524**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		100,096,048	102,262,101
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,919,728,285	4,714,751,263
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	8,895,387	11,794,412
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	1,042	5,748
මුළු වගකීම්		**4,028,720,762**	**4,828,813,524**

පිටු අංක…01…….සිට ……115… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ……116…. සිට ……135…. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.



3.3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	0	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	0	-
ලාභ	0	-
ආදායම් නොවන ලැබීම්	75,247,876	72,039,079
වෙනත් ශීර්ෂ වෙනුවෙන් tකත+ කරන ලද ආදායම්		
අග%sම ලැබීම්	1,505,595,000	1,513,548,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,580,842,876**	**1,585,587,079**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,507,302,870	1,431,811,989
සහනාධාර සහ මාරුකිරීම්	12,648,168	12,170,124
වෙනත් වැය Ysර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	8,406,646	3,491,698
භාණ්ඩාගාරයට පියවන ලද අගි%ම	1,042	5,748
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,528,358,725**	**1,447,479,559**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**52,484,150**	**138,107,520**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අය කර ගැනීම්	25,868,363	43,396,888
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**25,868,363**	**43,396,888**

අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	51,624,333	54,714,480
අත්තිකාරම් ගෙවීම්	23,829,155	59,479,928
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**75,453,488**	**114,194,408**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(49,585,125)**	**(70,797,520)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**2,899,025**	**67,310,000**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පත+ ලැබීම්	6,719,712	11,163,149
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**6,719,712**	**11,163,149**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පත+ ගෙවීම්	9,618,737	78,473,150
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**9,618,737**	78,473,150
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(2,899,025)**	**(67,310,001)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**0**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**1,042**	**5,748**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ප්‍රතිශතයක් ලෙස
2002.01.01	ගොඩනැගිලි කුලී	850,000	850,000	1,589,287	187%
2002.02.99	පොළිය	3,500,000	3,500,000	3,167,490	90 %
2003.99.00	අනෙකුත් ආදායම්	2,5000,000	2,5000,000	19,451,801	78%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු , 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබන ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,708,000	1,708,000	1,654,472	96.87%
ප්‍රාග්ධන	87,500,000	87,500,000	74,078,172	84.66%

3.7 මු. රෙ. 208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	රෝහල් කාර්ය මණ්ඩලය සහ සෙසු කාර්යමණ්ඩල වෙත කොරෝනා වෛරසය සඳහා ආරක්ෂිත උපකරණ සහ ඖෂධ නිෂ්පාදනය කිරීම	5,100	5,100	4,846	95%
02	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ රාජකාරී සඳහා දායක වූ නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම	958	958	958	100%
03	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය නිල නිවස අලුත්වැඩියා කිරීම සඳහා	2,000	2,000	1,826	91.28%
04	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	දෙපාර්තමේන්තුවට වාහන ලබා ගැනීම සඳහා	20.4	20.4	20.4	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු, 000

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		1,161,120.19		
9152	යන්ත්‍රෝපකරණ		434,988.1		
9153	ඉඩම්		2,338,520		

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HSM/C/AD/FA/20/02 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2020 අගෝස්තු 12 දින

ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි..

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
ශීර්ෂය 220- ආයුර්වේද දෙපාර්තමේන්තුව 2018 154(6) වාර්තාවේ		
(i) 1.6.5 (අ)	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ඇප තැබිය යුතු සියළු නිලධාරීන් පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් ඇප තැන්පත් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ii) 1.6.5 (ඇ)	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගත යුතුය.

(iii) 1.6.7	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා වත්කම් උපලේඛනය අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල අගය පිළිවෙලින් රු.4,714,733,263 ක් හා රු.4,771,377,854 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව එම අගය රු.3,919,728,286 ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු.795,004,977 ක් හා රු.851,649,568 ක් විය. වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. එසේම මූල්‍ය නොවන වත්කම්වල ලෙජර් ශේෂයන්, ස්ථාවර වත්කම් ලේඛනය හා අදාළ අනෙකුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ලේඛනවල කේවල ශේෂ සමඟ සැසඳෙන බවට තහවුරු කර ගැනීමකින් තොරව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ - 6 ආකෘතිය) පිළියෙල කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

(අ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව පුනරාවර්තන වැය විෂයයක් වෙත මාරු කර තිබුණු රු.10,365,000 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) මූලධන වැය විෂයයක් සඳහා සලසාගෙන තිබුණ රු.1,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනය එම වැය විෂයයේ අරමුණුගත කාර්යය සඳහා වැය නොකර වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණු අතර තවත් මූලධන වැය විෂයයන් 3 ක් සඳහා සලසාගෙන තිබුණු රු.300,000 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයක් යටතේ සලසාගෙන තිබුණු රු. 13,500,000 ක ප්‍රතිපාදනවලින් සියයට 75 කට වැඩියෙන් එනම් රු. 10,200,000 ක් එම වැය විෂයේ අරමුණුගත කාර්යය සඳහා වැය නොකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණු අතර තවත් මූලධන වැය විෂයයන් 4 ක් සඳහා සලසාගෙන තිබුණු රු. 3,670,000 ක ප්‍රතිපාදනවලින් සියයට 50 ත් සියයට 94 ත් අතර පරාසයක ප්‍රතිපාදන රු. 2,030,875 ක් ඉතිරිව තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 5 ක රු.117,470,000 ක් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත්වී නොතිබීම හේතුවෙන් රු.10,365,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගෙන රු.127,234,335 ක් වැය කිරීමෙන් පසුව රු.10,732,636 ක බැරකම්වලටද බැඳී තිබුණි. තවත් පුනරාවර්ථන වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.57,200,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.56,893,462 ක් වැය කිරීමෙන් පසුව රු.4,662,484 ක බැරකම්වලටද බැඳී තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වැය විෂයයක් වන කාර්යමණ්ඩල පුහුණු වැය විෂයය සඳහා සලසා ගෙන තිබුණු රු.150,000 ක ප්‍රතිපාදනවලින් රු.146,000 ක් වැයකිරීමෙන් අනතුරුව රු.1,405,000 ක බැරකම් වලට බැඳී තිබුණි. තවද ප්‍රතිපාදන සලසා නොතිබුණු ප්‍රාග්ධන වැය විෂයයක් වෙනුවෙන් රු.200,401,423 ක බැරකම් වලට බැඳී තිබුණි.

(ඊ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසාගෙන තිබුණු රු.39,530,000 ක ප්‍රතිපාදනවලින් සියයට 30 ක් එනම් රු.10,153,301 ක් අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබීම හේතුවෙන් ඉතිරිව තිබුණු අතර එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 24 සිට සියයට 48 දක්වා වූ පරාසයක පැවතුණි. තවත් වැය විෂයයන් දෙකක අස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 18 ක් හා සියයට 35 ක් වශයෙන් එකතුව රු. 5,309,940 ක් එම වැය විෂයයේ අරමුණුගත කාර්යය සඳහා වැය නොකර වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 11 ක රු.912,544 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.15,929,736 ක බැරකම් වලට බැඳී තිබුණු අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත් රු.200,401,423 ක බැරකම් වලට බැඳී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) යටතේ 2020 දෙසැම්බර් 31 දිනට ඇතුළත් කර තිබුණු රු.236,472,522 ක් වූ බැරකම්, මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ඇතුළත් කළ යුතු සටහන් අංක (iv) හි ඇතුළත් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ඖෂධ සංස්ථාවෙන් ඉකුත් වර්ෂවලදී ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් රු.1,253,831 ක්ද සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් රු.2,319,362 ක්ද ගෙවීමට ඇති බව එම සංස්ථාවේ ගිණුම්වලට අනුව තහවුරු වූ නමුත් එම වටිනාකම් බැඳීම් හා බැරකම් ප්‍රකාශයට (සටහන iii) ඇතුළත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

(අ)	1961 අ31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය	ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යාස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. කෙසේ වෙතත්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගයක් පදනම් කරගෙන ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන 15 ක් හා හෝටල් තුළ ස්ථාපිත පංචකර්ම ආයතන 26 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103 (i)	වාහන අනතුරු 6 ක අලාභය රු.234,281 ක් රක්ෂණ වන්දිවලින් ආවරණය කර ගෙන තිබුණු නමුත්, අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2019 වර්ෂයේදී මධ්‍යම ගබඩාවේ පැවති භාණ්ඩ ඌනතාවය වෙනුවෙන් අයකළ යුතු වටිනාකම රු.314,912 ක් ලෙස ගණනය කර තිබුණද, ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 10.1 ප්‍රකාර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 6 හි 3.3 වගන්තිය	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම්, වියදම් හා අනෙකුත් ප්‍රධාන ලෙජර් ශේෂයන්හි අගය ආසන්න රුපියලට වාර්තා කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආකෘති පත්‍ර හා අනෙකුත් සටහන්වල සංඛ්‍යා ආසන්න රුපියලට වාර්තා කර නොතිබුණි.
(ඈ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (**iv**) ඡේදය	වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණු මුළු මුදල හා අදාළ බැරකම්වල එකතුව රු.56,045,639 ක් විය.

2.4 **අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 39 දෙනෙකුගෙන් අයවීමට තිබුණු වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂවල එකතුව රු.මිලියන 1.65 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී වර්ෂ 5 ඉක්මවූ ණය වලින් රු.587,450 ක් පමණක් අයකර ගත හැකිව තිබුණි. ස්ථාන මාරුවී ගිය, මිය ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය අයකර ගැනීම දුර්වල තත්වයක පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(2) හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ පළමු ඡේදය ප්‍රකාරව, ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, විවිධ කාර්යයන් සඳහා අවස්ථා 42 කදී නිකුත්කර තිබුණු රු.1,290,003 ක අත්තිකාරම් හා එම අත්තිකාරම්වලින් ඉතිරි මුදල් රු.81,996 ක් පියවීමට අත්තිකාරම් නිකුත් කළ දින සිට මාස 01 ත් මාස 06 අතර කාලයක් ගත කර තිබුණි. තවද නිලධාරීන් 07 දෙනෙකුට අවස්ථා 09 කදී නිකුත්කර තිබුණු රු.132,575 ක අතුරු අග්‍රිම අදාළ කාර්යය සඳහා යොදා නොගෙන දින 03 ත් දින 30 ත් අතර කාලයක් අත රඳවාගෙන ආපසු ගෙවා තිබුණි. එසේම නිලධාරීන් 05 දෙනෙකුට අවස්ථා 16 කදී නිකුත් කර තිබුණු රු.256,868 ක අතුරු අග්‍රිම පියවීමට පෙර තවත් රු.429,098 ක අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදී තිබුණු අතර එහි සාර්ථකත්වය මත ව්‍යාපෘති ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු විය. නමුත් එපරිදි කටයුතු නොකර වර්ෂ 15 ක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා රු.මිලියන 608 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 142.71 ක ප්‍රතිපාදනවලින් නිලධාරීන් 225 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 133.72 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 4.14 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 138 ක් වැයකර තිබුණි. අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීම සම්බන්ධව 2005 වර්ෂයේදී අමාත්‍යය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණද ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

මැදවච්චිය වකුගඩු රෝහල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල රු.85,372,218 ක් 2014 වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවා තිබුණි. 2019 දෙසැම්බර් මාසයේදී ඉදිකිරීම් අවසාන කිරීමෙන් පසු අතිරික්ත මිලදී ගැනීම් හේතුවෙන් ඉතිරි වූ රු.1,683,644 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව වෙත බාර දී තිබුණි. නමුත් එපරිදි ඉතිරිව තිබුණු වානේ කම්බි, වටිනා ලී වර්ග ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය රැසක් අනාරක්ෂිතව, අක්‍රමවත්ව හා නිෂ්කාර්යව වර්ෂයකට අධික කාලයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.

3.3 අනාවරණීය ගනුදෙනු

අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් මෙම වාර්තාවේ දිනය වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම් වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාවරණීය වියදමක් විය.

4. මානව සම්පත් කළමනාකරණය

2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,647 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 1,679 වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 37 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 968 ක් විය. එම පුරප්පාඩු තුළ බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණායතනයේ හා ආයුර්වේද ශික්ෂණ රෝහලේ පිළිවෙලින් ජ්‍යේෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියයට 29 ක් හා සියයට 27 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු සියයට 96 ක් හා සියයට 100 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු සියයට 63 හා සියයට 69 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සියයට 41 ක් හා සියයට 60 ක්ද විය. ඊට අමතරව ආයුර්වේද රෝහල් 9 ක් ඇතුළු ආයතන 11 ක අනුමත කාර්යය මණ්ඩලය 11 ත් 704 ත් දක්වා වූ පරාසයක පැවතියද ඉන් සියයට 20 ත් සියයට 75 ත් අතර පරාසයකට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 6 ත් 385 ත් අතර සංඛ්‍යාවක් විය. ඒ තුළ අධ්‍යක්ෂක හා නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 8 ක්, ආයුර්වේද වෛද්‍ය තනතුරු 35 ක්, විශේෂ වෛද්‍ය තනතුරු 30 ක්, පරිපාලන නිලධාරී තනතුරු 9 ක්, ඖෂධවේදී තනතුරු 33 ක්, ඖෂධ සංයෝජක තනතුරු 22 ක්, හෙද තනතුරු 84 ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 32 ක් හා ආයුර්වේද සේවා සහායක තනතුරු 151 ක්ද විය. තවද දෙපාර්තමේන්තුවට අයත් ඔසු උයන් 8 ක අනුමත කාර්යය මණ්ඩලය 03 ත් 76 අතර පරාසයක පැවතියද තථ්‍ය සේවක සංඛ්‍යාව 02 ත් 41 ත් දක්වා වූ පරාසයක පැවති බැවින් පුරප්පාඩු සංඛ්‍යාව 01 ත් 35 ත් අතර පරාසයක පැවතුණි. ඉන් ඔසු උයන් 06 ක පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 45 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. තවද ඔසු උයන් 06 ක අධීක්ෂණ කටයුතු ගොවිපළ කළමනාකරුවකු යටතේ සිදුවිය යුතු වුවත් එම තනතුරු 06 ම පුරප්පාඩුව පැවතුණි.

අයි.සමරගේ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4. පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

2020 වර්ෂය සඳහා සකස් කර නොමැත, 2021 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

5. පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

2020 වර්ෂය සඳහා තිරසාර අරමුණු හඳුනා ගෙන නොමැති අතර 2021 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

6. පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	728	622	106
තෘතීයික	48	09	39
ද්විතීයික	541	233	308
ප්‍රාථමික	1,040	546	494

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

- ආයතනයේ පවතින ඇබෑර්තු හේතුවෙන් දෛනික කටයුතු සිදු කිරීමට දැඩි බාධාවක් එල්ල වී ඇත.
- නිලධාරීන්ගේ කාර්යබහුලත්වය නිසා කායික හා මානසික පීඩනය හේතුවෙන් සමස්ත ඉලක්ක කරා ළඟා වීමට අපහසු වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)
			දේශීය	විදේශීය	
දෙපාර්තමේන්තුව පාලන අංශය මඟින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන්					
දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධනය පිළිබඳ වැඩසටහන	1. සංවර්ධන නිලධාරී 2. ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී 3. රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර — 60	2020.01.23,24,30, 31	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් නොමිලේ සිදු කරන ලදි.		දේශීය
Training programme on payroll system	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර - 02	2020.01.29,30,31	36,000		දේශීය
රාජ්‍ය භාෂා ප්‍රත්පත්තිය පිළිබඳ දැනුවත් කිරීම	මාණ්ඩලික නිලධාරී - 03	2020.03.12	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නොමිලයේ පවත්වන ලදී.		දේශීය
විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර - 08	2020.07.27	40,000		දේශීය
Stores Management and Purchasing procedures	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර - 01	2020.08.26	8,500		දේශීය
අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලසුම්	සංවර්ධන නිලධාරී - 02	2020.08.27	14,000		දේශීය
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පුහුණු වැඩමුළුව	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර - 04	2020.09.02,03	34,000		දේශීය
රජයේ දේපළ හානි, අලාභ, නැතිවීම් හා අනතුරු පිළිබඳව ක්‍රියා පටිපාටිය	රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර - 01 අභ්‍යන්තර විගණක -01	2020.09.10	14,000		දේශීය

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අදාළ නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලු විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.		පිළිතුරු ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් හා යන්ත්‍ර ඌන උපයෝජනය සම්බන්ධයෙන් විශේෂිත වූ විගණන විමසුම් හැර අනෙකුත් විගණන විමසුම් සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී ඇත.	මෙලෙස විශේෂිත වූ විගණන විමසුම් හැර හැකි සෑම විටම නියමිත දිනට පිළිතුරු ලබාදීමට කටයුතු කරයි.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.		පුහුණු සේවකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.	හැකි සෑම විටම නියමිත දිනට පිළිතුරු ලබාදීමට කටයුතු කරයි.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	වාර්තා කිරීම සඳහා තොරතුරු සකස් කරමින් පවතී		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ	පසුගිය වර්ෂ දෙකක පමණ ධාවන සටහන් පරීක්ෂා කර නොතිබීම නිසා ප්‍රමාණවත් කාලයක් නොතිබීම	එම වර්ෂවල ධාවන සටහන්ද පරීක්ෂා කරමින් පවතී
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යෑම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මූ.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මූ.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මූ.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර. වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට අවස්ථාව සලසා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කළ නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		